DOI: 10.31357/fhssmst.2009.00029

# පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් හා ක්‍රියාමාර්ග

එළමල්දෙණියේ සාරානන්ද හිමි

ලේඛ්‍යාරූඪ අංකය :- GS/HU/2243/2003

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති පරීක්ෂණය සඳහා

බෞද්ධ ශිෂ්ටාචාරය යටතේ ඉදිරිපත් කරන නිබන්ධය යි.

## සුපරීක්ෂක ප්‍රකාශය

මෙම අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මේ නිබන්ධය ඇගයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2010 - 02 - 12 වැනි දින පැවැති වාචික පරරීක්ෂණයේ දී පෙන්වා දුන් සංශෝධනයන් සහිත ව ඉදිරිපත් කෙරෙන බව ප්‍රකාශ කර සිටිමු.

| සුපරීක්ෂකගේ නම | අත්සන. | දිනය . |
|---|---|---|
| 01. මහා. ආරියපාල පෙරේරා මයා | | 2010.03.10. |
| 02. ආචාර්ය එන්.එල්.ඒ. කරුණාරත්න මයා | | 2010/03/10 |

## කර්තෘගේ ප්‍රකාශය

මෙම නිබන්ධයේ අන්තර්ගතය මහාචාර්ය, ආරියපාල පෙරේරා ඇදුරුතුමන්ගේ සහ ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය, එන්.එල්.ඒ. කරුණාරත්න ඇදුරුතුමන්ගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත් මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන්, වෙනත් විශ්වවිද්‍යාලයකට, ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ඉදිරිපත් නොකරන ලද බවටත් සහතික කරමි.

23-03-09 ..................

දිනය

අපේක්ෂකයාගේ අත්සන

## උපදේශකවරුන්ගේ නිර්දේශය

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මේ නිබන්ධය ඇගැයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමු.

1. .................................... 23-03-2009

මහාචාර්ය ආරියපාල පෙරේරා — දිනය

උපදේශක

2. .................................... 25-03-2009

ආචාර්ය එන්.එල්.ඒ. කරුණාරත්න — දිනය

උපදේශක

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
25 MAR 2009
පශ්චාද් උපාධි අධ්‍යයන

## පිළිගැන්වීම

මා මෙලොවට බිහි කළ

දයාබර මවුපිය දෙපළටත්,

පැවිදි දිවියට යොමු කළ

මාතර සමථ මූල මණ්ඩලයේ ගරු සභාපති

සිද්ධාර්ථෝදය පරිවේණාධ්‍යක්‍ෂ

මාතර චාරිකාරාමය, අශෝකාරාමය,

දිවියාගහ රට්ඨපාල විහාරය ආදි

විහාරස්ථානයන්හි අධිපති අස්මදාචාර්ය

රාජකීය පණ්ඩිත, ගෞරවාර්හ දිවියාගහ ගුණානන්ද

මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේටත්,

අපවත් වී වදාළ

දෙහිවල පින්වත්ත පුරාණ විහාරය,

කළුබෝවිල ශ්‍රී සුනන්දාරාමය

යන උභය විහාරාධිපති,

කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහාසංඝ සභාවේ

කර්මවාගාචාර්ය, සල්පිටිකෝරළයේ ප්‍රධාන සංඝනායක

ශාස්ත්‍රවේදී, විද්‍යානිධි ගෞරවාර්හ

කහතුඩුවේ හේමසිරි නාහිමිපාණන් වහන්සේටත්,

මේ කෘතිය සබහුමාන ව පිළිගන්වමි.

# උපකාරානුස්මෘති

නූතන ලෝකයේ සෑමදෙනාට කිසිදු භේදයකින් තොර ව එකසේ වැදගත් වන සංකල්පයක් ලෙස 'පරිසර' සංකල්පය හඳුන්වා දිය හැකි ය. අද්‍යතන යුගයේ පරිසර ගැටලු දිනෙන් දින තීව්‍ර වෙමින් පවතී. එකී පරිසර ගැටලු සංසිඳවීමෙහි ලා උපයුක්ත ක්‍රමවේදයන් කවරේදැයි දිනෙන් දින මානව සමාජය ගවේෂණය කරමින් සිටියි. එවැනි පසුබිමක් තුළ "පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් හා ක්‍රියාමාර්ග" කවරේදැයි විමර්ශනය කිරීම විෂයයෙහි මෙම පර්යේෂණ ග්‍රන්ථය මගින් උත්සාහ දරා තිබේ.

එකී උත්සාහය මල්පල ගන්වනු වස් ප්‍රමුඛ වූවෝ කිහිපදෙනෙක් මාර්ගෝපදේශකත්වය ලබා දෙමින් එහි ප්‍රතිඵල දකින්නට දිරි දුන්හ. ඒ අතර ඉහත මාතෘකාව අවශ්‍ය පරිදි සකසා ගන්නට මූලික මාර්ගෝපදේශකත්වය ලබාදුන් මහාචාර්ය, චන්ද්‍රිම විජේබණ්ඩාර ඇදුරුතුමා ප්‍රමුඛ චරිතයකි. මාතෘකාව නිර්දේශ වූ දින පටන් එහි නිමාව දක්වා සියලු කරුණු පිළිබඳ මනාව අධීක්ෂණය කරමින් උක්ත මාතෘකාවට අදාළ ව පර්යේෂණය කිරීම විෂයයෙහි සෑම විට ම ධෛර්යය සැපයූයේ මහාචාර්ය ආරියපාල පෙරේරා ඇදුරුතුමා සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය එන්.එල්.ඒ. කරුණාරත්න ඇදුරුතුමාත් ය. ඒ දෙපළ නිරතුරු ව ලබාදුන් ධෛර්යය හා ශක්තිය කෘතවේදී ව සිහිපත් කරමි.

මෙම පර්යේෂණ නිබන්ධ මාතෘකාව අනුමත වූ දින සිට නිරතුරු ව ඒ පිළිබඳ සොයා බලමින් දිරි ගැන් වූ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ හිටපු අංශාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කේ.ඒ. වීරසේන ඇදුරුතුමන් විසින් ඉටුකරන ලද සුවිශාල මෙහෙවර සිහිපත් කරනුයේ හදපිරි කෘතවේදීත්වයෙනි.

පර්යේෂණ නිබන්ධය සකසන අතරතුර ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයෙහි අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වූ සම්මන්ත්‍රණ මාතෘකා නිර්දේශ කොට දෙමින්

උපදේශකත්වය ලබාදුන් පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ අංශ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය, නායිම්බල ධම්මදස්සි ගුරු හිමිපාණන්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය, මාගම්මන පඤ්ඤානන්ද හිමිපාණන් ඇතුළු ගිහි පැවිදි ආචාර්ය මණ්ඩලයේ සෑම දෙනාට මාගේ කෘතඥතාව පළකර සිටිමි.

සෝදු පත් බැලීමේ දී එය නිසි පරිදි සිදුකර දුන් පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ හිටපු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දර්ශනපති, එච්.එම්. මොරටුවගම ඇදුරුතුමන් සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශයේ කථිකාචාර්ය, රාජකීය පණ්ඩිත, මීපිටියේ සීලරතන හිමියන් ද සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ කථිකාචාරිණී, අනුරාධා මෙහෙණින් වහන්සේ ද ඉතා කෘතවේදී ව සිහිපත් කරමි.

පරිගණක යතුරු ලියන මැනවින් සිදුකරදුන් සැණික්ටා ආයතනයේ සාමා පුෂ්ප කුමාරි මෙණවිය ද සිහිපත් කරන අතර, මේ සඳහා ධෛර්යය සැපයූ මාගේ ශාස්ත්‍රීය කාර්යයන්ට අවංක සිතින් ආශිර්වාද කරන සෑම දෙනා සිහිපත් කරමි. ඒ සියලු දෙනාට ම නැණ පහන් දල්වාගනු පිණිස නිදුක් නිරෝගී සුවය ප්‍රාර්ථනා කරමි.

# සංකේත නිරූපණය

| | | |
|---|---|---|
| අං. නි. | - | අංගුත්තර නිකාය |
| ඍග් | - | ඍග්වේදය |
| ඛු. නි. | - | ඛුද්දක නිකාය |
| චු. ව. | - | චුල්ලවග්ග පාලි |
| දී. නි. | - | දීඝ නිකාය |
| ධ. ප. | - | ධම්මපද පාලි |
| නි. | - | නිකාය |
| නිපා. | - | නිපාතය |
| පරි. | - | පරිවර්තනය |
| පාචි. | - | පාචිත්තිය පාලි |
| පි. | - | පිටුව, පිටු. |
| බු. ජ. සං. | - | බුද්ධ ජයන්ති සංස්කරණ |
| ම. නි. | - | මජ්ඣිම නිකාය |
| ම. ව. | - | මහාවග්ග පාලි |
| සං. නි. | - | සංයුත්තනිකාය |
| සංස්. | - | සංස්කරණය |
| Ed. | - | Edition |
| P. | - | Page |
| P.T.S. | - | Pali Text Society |
| PP. | - | Pages |
| Vol. | - | Volume |

# හැඳින්වීම

විශ්ව කේන්ද්‍රීය සංකල්පයක් වන පරිසර සංකල්පය පිළිබඳ බෞද්ධ දෘෂ්ටිකෝණය විමසා බැලීමේ දී පෙනී යන්නේ සෘජුව ම ඒ පිළිබඳ අදහස් දැක්වීම බෞද්ධ ධර්ම මාර්ගය නොවන බවයි. බුදුදහමේ මූලික කාර්ය භාර්ය වනුයේ ශ්‍රාවකයන් වෙත සදාකාලික ලෝකෝත්තර සුවය පිණිස මාර්ගෝපදේශකත්වය සැපයීම යි. එහෙත් බුදුරදුන් ජීවත් වූ කාලය සහ උන්වහන්සේ දේශනා කළ ධර්මය විමසීමට ලක් කරන විට පරිසර දූෂණයේ දුර්විපාක හා පරිසර සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳව අදහස් ඉදිරිපත් වී ඇති බව පෙනී යයි. බුද්ධ චරිතයේ එන බොහෝ සිද්ධි සිදුව ඇත්තේ ග්‍රාමීය ප්‍රදේශවල ය. තෙමහල් සිදුවීම්, පළමු දහම් දෙසුම ආදි බුද්ධ චරිතයේ මූලික සිදුවීම් සියල්ල සොබාදහමේ වස්තූන් සමඟ බැඳී පවතින අයුරු දැක ගත හැකි අතර, ස්වාභාවික පොළොව මත පහළ වන ජීව අජීව සියල්ල පරිසරය වශයෙන් හඳුන්වා ඇත.

පරිසරය ලොව ජීව අජීව සියලු දෙයකින් ම සමලංකෘත වූ සංකීර්ණ පද්ධතියකි. පරිසරය ලෙස ස්වභාව ධර්මය, ලෝකය, වටපිටාව යනුවෙන් අධ්‍යයනය කළ හැකි ය. බුදුදහමේ දී පරිසරය "පතිරූප දේස" ලෙස බෙදා දක්වා තිබේ. පරිසරය සොබා දහමට අයත් ගංගා, ඇළ-දොළ, වන-ලැහැබ්, ගිරි-ශිඛර, මිටියාවත්, වෘක්ෂලතාවලින් පිරී ගිය උද්‍යාන, සඳ පහන් රැය, අරුණෝදය, වැසිවලා, මේඝ ගර්ජනා, ගිරි ගුහා, වන සිවුපාවුන් සහ පක්ෂීන් ආදිය දක්වා තිබේ. ආදි බුදුසමයේ චින්තන මාර්ගය ප්‍රකට කරන මූලග්‍රන්ථ කිහිපයක ම පරිසර සංකල්පය ධ්වනිත කරවන පද කිහිපයක් විද්‍යමාන වේ.

'ලෝක' යන පදය විවිධ ස්ථානවල විවිධ අරුත් ගෙනදීම සඳහා යෙදී ඇතත්, 'පරිසරය' යන අර්ථය ගෙනදීම සඳහා යෙදී ඇති තැන් බහුල ය. ඒ අතර සුත්ත නිපාතයේ එන මෙත්ත සූත්‍රයේ දී පරිසරය අර්ථවත් වන බව ඉතා පැහැදිලි ය. කිසියම් පුද්ගලයෙකුට සාපේක්ෂ ව ඔහු වටා ඇති සියලු ම දෑ ලෝක ශබ්දයෙන් අර්ථවත් කොට ඇත.

උඩ, යට හා වටා ඇති සියලු ලොව වෙත බාධා විරහිත අවෛරී සහ සතුරන් නොමැති අපමණ වූ මෙත් සිත වඩන්නේ ය.

මහා සතිපට්ඨාන සූත්‍රයේ දී පරිසර සංකල්පය ධ්වනිත කරනු පිණිස යොදාගෙන ඇත්තේ 'අජ්ඣත්ත-බහිද්ධ' යන පද දෙක යි. 'අජ්ඣත්ත' යනු යම් පුද්ගලයකු ගේ කායික හා මානසික ක්‍රියාකාරිත්වයන්ගෙන් සමන්විත අභ්‍යන්තර පරිසරය යි. 'බහිද්ධ' යනු පුද්ගලයා අවට ලෝකයෙහි පවතින බාහිර පරිසරය යි. මෙලෙස සමස්ත පරිසරය පිළිබඳ ව මෙම සූත්‍රයේ දී කරුණු පැහැදිලි කරයි.

එයට අමතර ව 'පරිසරය' යන්න පිළිබඳ ව විවිධ වියතුන් විසින් විවිධ නිර්වචන ඉදිරිපත් කොට ඇත. "ජීවියා ගේ පැවැත්ම කෙරෙහිත්, සංවර්ධනය කෙරෙහිත් බලපාන සියලු බාහිර තත්ත්වවල හා හේතුඵලවල එකතුව පරිසරය යි. "ජීවියෙකු වටා ඇති භෞතික රසායනික හා ජෛවීය තත්ත්වය පරිසරය වේ." මේ අනුව භෞතික, රසායනික පදාර්ථ ශක්තීන් සංයෝගවීමෙන් නිර්මාණය වී ඇති ජීව අජීව සියල්ල පරිසරයට අයත් බව පිළිගැනෙයි.

සංවර්ධනය විෂයයෙහි ලොව කාර්මීකරණයට නැඹුරු වීමත් සමඟ සුවිශේෂ දියුණුවක් ලබා ඇත. අතින් කෙරෙන භාණ්ඩ නිෂ්පාදනය බලවේග මගින් ක්‍රියාත්මක කෙරෙන යන්ත්‍ර සූත්‍ර මාර්ගයෙන් සිදුකිරීම හේතුවෙන් සමාජ සංස්ථාව නවතම පරිවර්තනයකට ලක් විය. කාර්මීකරණය මිනිස් ඉතිහාසයේ ලබා ගත් විශිෂ්ට ජයග්‍රහණයක් වුව ද එමගින් උද්ගත වී ඇති ගැටලු රාශියකි. ඒ අතර පරිසරයට එල්ල වී ඇත්තේ ප්‍රබල තර්ජනයකි. මිනිසා හමුවේ ඇති තීරණාත්මක එමෙන් ම බරපතළ ලෙස මැදිහත් වී විසඳිය වුතු ප්‍රබල ගැටලුවක් නම් පරිසරය දූෂණය යි.

මිහිතලයේ සෑම බිම් අඟලක් ම මානවයාට පූජනීය සිද්ධස්ථාන බඳු ය. සොබා දහමෙන් තොර පැවැත්මක් මානවයාට සිතන්නටවත් නොහැකි ය. අද ජීවත් වන දියුණු යැයි කියා ගන්නා මිනිස්සු මේ වනාන්තර කපා හෙළති. ගිනි තබති. කඳු බෑවුම් ඇදහෙළා උස් තැනිතලා ද සූරා පුළුස්සා වගාවට යොදා ගනිති. මෙය තාවකාලික සහනයක් පමණි. "පරිසරය මධ්‍යයෙහි මිනිසා ගේ ආධිපත්‍යය පවත්වා ගැනීමට නම් ඔවුන් ගේ ක්‍රියා එක්තරා ස්වාභාවික නියමයන් ගණනකට අනුකූල විය යුතු වෙයි. ඔහු ඒ නියමයන්

උපායයන් මහහැරීමට වැයම් කරන විට, ඔහු ගේ පෝෂණය සලසන පරිසරය වේගයෙන් පිරිහෙන විට ඔවුන් ගේ ශිෂ්ටාචාරය ද ක්‍රමයෙන් පසුබසින්නේ ය."

මිහිකත අපේ මාතාව බැවින් අපි ඇය ගේ දරුවෝ වෙමු. අප ඇය හා බැඳී සිටින්නාක් මෙන් ම ඇය අප හා බැඳී සිටින්නී ය. සුවඳැති මල් හා තුරුලතා අපේ සහෝදරයෝ වෙති. අශ්වයෝ, මුව පොව්වෝ, දැවැන්ත රාජාලියෝ අප ගේ සහෝදරයෝ ය. කඳු වැටි අතර හා නිම්නයේ ගලා බසින දිය දහර, තණබිම්වල තෙතමනය, අශ්ව පැටවුන් ගේ හා මිනිසුන් ගේ උණුසුම යන මේ සියල්ල ම එක ම පවුලකි. ස්වභාව සෞන්දර්යය හා මිනිසා අතර පවත්නා සබඳතාව අවියෝජනීය වූවකි.

මානව සමාජය කාර්මීකරණය පිළිබඳ සිතන්නටත් පෙර බුදුරදුන් නම් ශ්‍රේෂ්ඨ පරිසර වේදියාණෝ වසර දහස් ගණනක් අනාගතය දෙස බලා පරිසර සංරක්ෂණයේ අගය වදාළහ. ලොව පහළ වූ ශ්‍රේෂ්ඨ ශාස්තෘවරයෙකු වශයෙන් සියලු දෙනා ගේ වන්දනාවට පාත්‍ර වූ බුදුවරයෙකුට අධික සැප පහසුකම් මැද්දේ අවසන් මොහොත ගත කරන්නට හැකියාව තිබුණි. එහෙත් බුදුරදුන් ගසක් යට ඉපිද, ගසක් යට බුද්ධත්වය ලබා, ගසක් යට දී ම පරිනිර්වාණයට පත් වූයේ මිනිස් වර්ගයා සහ සොබා දහම අතර පවත්නා අවියෝජනීය සබඳතාව ලෝකයාට ආදර්ශයෙන් පෙන්වමිනි.

දිනෙන් දින වර්ධනය වන ලෝක ජනගහණය හේතුවෙන් පරිසර දූෂණය සහ විනාශය ද ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත. ගස්කොළං නොමැති කාන්තාරවල ජලය සිඳී ගොස් අධික රස්නය නිසා මිනිස් ජීවිත විනාශ වීමත්, වනාන්තර එළි-පෙහෙළි කිරීම නිසා නාය යෑම් ආදිය හේතුවෙන් විශාල ජීවිත හානිත් සිදුවෙයි.

මිනිසා පොළෝ තලයෙන් සහමුලින් ම වැනසීයාමේ තර්ජනයට මුහුණ පාන්නේ සොබා දහමේ සුන්දරත්වය විනාශ වූ දිනට ය. ගෝත්‍රික ජනයා පවා ඇලුම් කරන පරිසරය පාදක කොට ගනිමින් කාලීන දැවෙන ගැටලුවක් වන පරිසර ගැටලු නිරාකරණය විෂයයෙහි පරිසර සංරක්ෂණයේ අවශ්‍යතාව පෙන්වා දීම ප්‍රබල අවශ්‍යතාවකි.

පරිසර සංරක්ෂණය විෂයයෙහි කෙබඳු ආකල්පයක් බුදුසමයේ පවතින්නේ දැයි විමසීම විෂයයෙහි බෞද්ධ ඉගැන්වීම් සහ ක්‍රියාමාර්ග විමසුමට ලක් කළ යුතු වෙයි. පරිසර සංරක්ෂණය විෂයයෙහි මානව ප්‍රජාව පෙළගැස්වීම උදෙසා ඒ සඳහා ඉදිරිපත් කර ඇති බෞද්ධ ඉගැන්වීම් කවරේ දැයි විමර්ශනය කොට, ඒ සඳහා යොදා ගත හැකි ක්‍රියා මාර්ග කවරේ දැයි බුද්ධ දේශනා තුළින් අනාවරණය කරගැනීම මෙම පර්යේෂණයේ අපේක්ෂාව යි.

එහි දී අදාළ ප්‍රස්තුතය පුළුල් ව විමර්ශනය කිරීම විෂයයෙහි බුදුදහම හැර සෙසු ආගම් සහ දර්ශනවලින් නිරූපිත පරිසර සංකල්පය හඳුනා ගැනීම සඳහා පළමු පරිච්ඡේදය පෙළගස්වා තිබේ. හින්දුදහම, ජෛනදහම, කිතුදහම, ඉස්ලාම්දහම, කොන්ෆියුසියස්දහම සහ ශරතුස්ත්‍රදහම තුළ පරිසර දෘෂ්ටිය විමසීමට ලක් කරයි. මෙයට අමතර ව බටහිර දාර්ශනික ආකල්පවල නිරූපිත පරිසර සංකල්පය ද කෙටියෙන් විමසුමට ලක් කෙරේ.

දෙවැනි පරිච්ඡේදයේ දී බලාපොරොත්තු වූයේ බුදුදහමේ පරිසරය අගැයීමට ලක්කොට ඇති අයුරු පරීක්ෂා කිරීම ය. පරිසර සංරක්ෂණය විෂයයෙහි මාර්ගෝපදේශකත්වය ලබා දෙන බුදුදහම එය කෙසේ අගැයීමට ලක්කොට ඇද්දැයි විමසීමට ලක් කරයි. බුදුරදුන් ස්වකීය සම්බුද්ධ චරිතය තුළින් පරිසරයේ අගනාකම් ප්‍රකට කර ඇති අයුරු බුද්ධ දේශනාවල විවිධ ස්ථානවලින් ඒකරාශී කර දක්වා ඇත. මෙයට අමතර ව විරාගී උතුමන් පරිසරය දුටු අයුරු විමසීමට ලක් කෙරෙයි. එහි දී ථේර-ථේරී ගාථා ඇසුරු කර ගනිමින් පරිසරය වර්ණනාවට ලක්කර තිබෙන ආකාරය විමසා බැලෙයි.

තෙවැනි පියවර යටතේ බලාපොරොත්තු වූයේ පරිසර දූෂණය පිළිබඳ අවධානය යොමු කිරීම යි. එහි දී පරිසරය දූෂණය වන ක්ෂේත්‍ර ලෙස වායු දූෂණය, ජල දූෂණය, වනාන්තර දූෂණය, ගොඩබිම දූෂණය, ශබ්ද දූෂණය සහ සංස්කෘතික දූෂණය ප්‍රධාන ලෙස සාකච්ඡාවට බඳුන් කොට පරිසර දූෂණයවන අයුරු විමර්ශනය කොට ඇත.

පරිසර ගැටලු නිරාකරණය විෂයයෙහි පරිසර සංරක්ෂණයේ අවශ්‍යතාව පෙන්වාදීම ප්‍රබල අවශ්‍යතාවකි. ලොව දරුණුත ම ගැටලුවක් වන පරිසර දූෂණය අවම කරගත හැක්කේ ඒ සඳහා සංරක්ෂණ ක්‍රියා යොදා ගැනීමෙනි. පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ දෘෂ්ටිකෝණය විමසීමේ දී එය අංශ දෙකක් යටතේ විමසිය හැකි ය. එනම් විනය පිටකය හා සූත්‍ර පිටකය යන දෙයංශයෙනි. ඒ අංශ දෙකින් එක් අංශයක් පිළිබඳ සිවුවැනි පරිච්ඡේදයේ දී විග්‍රහ වේ. එනම් බෞද්ධ විනය පිටකය තුළ අන්තර්ගත පරිසර සංරක්ෂණ ක්‍රමවේද හා ඉගැන්වීම් විමර්ශනය කෙරෙයි. එහිදී චුල්ලවග්ග පාලි, මහාවග්ගපාලි, පාරාජිකාපාලි. පාචිත්තිය පාලි, පරිවර පාලි, යන විනය ග්‍රන්ථ තුළ අන්තර්ගත භික්ෂු විනයෙහි පරිසර සංරක්ෂණය විෂයයෙහි අදාළ කර ගත හැකි බෞද්ධ ඉගැන්වීම් සහ ක්‍රියාමාර්ග සාකච්ඡා කොට ඇත.

පස්වැනි පරිච්ඡේදයේ දී බෞද්ධ සාහිත්‍යයෙන් ඉගැන්වෙන පරිසර සංරක්ෂණ ක්‍රමවේද අධ්‍යයනය කරනු ලැබේ. මෙහි දී සූත්‍රපිටකයේ ඇතුළත් විවිධ වූ සූත්‍රධර්ම උපනිඃශ්‍රය කරගෙන ඇති අතර, බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ අතුරින් ජාතක පොතෙහි එන විවිධාකාර පරිසර සංරක්ෂණ ක්‍රමවේද පිළිබඳ අවධානය යොමු කොට තිබේ. ජාතක පොතට අමතර ව ධම්මපදය ආදි ග්‍රන්ථ ද සුවිශේෂ වශයෙන් පරිශීලනය කොට පරිසර සංරක්ෂණ ක්‍රමවේද සහ ඉගැන්වීම් පර්යේෂණයට බඳුන් කොට ඇත.

ඉහත කී පරිච්ඡේදවලින් පසුව නිගමනය ද, ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය ද පරිසර දූෂණයේ ස්වභාවයන් සහ පරිසර සංරක්ෂණයේ ස්වභාවයන් විද්‍යමාන වන ඡායා ඵලකයන් ද ඉදිරිපත් කොට තිබේ.

## අධ්‍යයනයේ අරමුණු

පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් හා ක්‍රියාමාර්ග යන මැයෙන් ඉදිරිපත් කරනු ලබන නිබන්ධයෙහි පහත සඳහන් අරමුණු සාධනය කර ගැනීමට අපේක්ෂිත ය.

I. තාක්ෂණයේ දියුණුවත් සමඟ වර්තමානයේ උග්‍ර සමාජ ගැටලුවක් ලෙස පරිසරය විනාශ වීමේ උවදුර හඳුනා ගැනීම.

II. බුදුදහමේ ඇති පරිසරය සුරැකීමේ ආකල්පය බුද්ධ දේශනා ඇසුරින් වටහා ගැනීම.

III. අනාගතයේ දී පරිසරය සුරැකීම විෂයයෙහි ගත යුතු ක්‍රියා මාර්ග කවරේ දැයි බුද්ධ දේශනා ඇසුරින් විමර්ශනය කිරීම.

IV. පරිසර සංරක්ෂණයෙන් ලද හැකි පාරිසරික සහ මානසික සුව සහනය කෙබඳු දැයි පර්යේෂණානුසාරයෙන් හඳුනා ගැනීම.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා අනුගමනය කරන ලද ක්‍රමවේදය

1. මූලාශ්‍ර අධ්‍යයනය (Study of Sources)
2. සම්මුඛ සාකච්ඡා ක්‍රමය (Interview Methods)

මෙහි දී අධ්‍යයනය කරන ලද මූලාශ්‍රයන් ප්‍රධාන වශයෙන් ප්‍රාථමික මූලාශ්‍රයෝ, ද්විතීයක මූලාශ්‍රයෝ වශයෙන් දෙවැදෑරුම් වෙති.

**ප්‍රාථමික මූලාශ්‍රයෝ**

- පාඨ ග්‍රන්ථ
- අටුවා ග්‍රන්ථ
- ප්‍රකරණ ග්‍රන්ථ

**ද්විතීයක මූලාශ්‍රයෝ**

- විචාරාත්මක ග්‍රන්ථ
- සංස්කරණ ග්‍රන්ථ
- විශ්ව කෝෂ
- ශබ්ද කෝෂ
- ලිපි ලේඛන
- වාර සහරා

සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදයෙහි දී මෙම විෂය කෙරෙහි විශේෂඥතාවක් දක්වන විද්වතුන් ගේ මහපෙන්වීම ලබා ගෙන ඇත.

# පටුන

**පිටු අංකය**

කර්තෘ ප්‍රකාශය II

උපදේශක නිර්දේශය II

පිළිගැන්වීම III

උපකාරානුස්මෘති IV-V

සංකේත නිරූපණය VI

හැඳින්වීම VII-XI

අධ්‍යයනයේ අරමුණු XII

ක්‍රමවේදය XIII

පටුන XIV-XV

**පළමුවැනි පරිච්ඡේදය**

**පරිසරය : ආගමික හා දාර්ශනික මතවාද සමීක්ෂා** **1-33**

1.1 පරිසරය : හින්දු ආගමික ආකල්පය

1.2 පරිසරය : ජෛන ආගමික ආකල්පය

1.3 පරිසරය : ක්‍රිස්තියානි ධර්මයේ ආකල්පය

1.4 පරිසරය : ඉස්ලාම් ධර්මයේ ආකල්පය

1.5 පරිසරය : කොන්ෆියුසියස් ධර්මයේ ආකල්පය

1.6 පරිසරය : ශරතුස්ත්‍ර ධර්මයේ ආකල්පය

1.7 පරිසරය : බටහිර දාර්ශනික ආකල්ප

**දෙවැනි පරිච්ඡේදය**

**මුල් බුදුසමය සහ පරිසරය** **34-63**

2.1 පරිසරය සහ බුදුරජාණන් වහන්සේ

2.2 විරාගී උතුමන් පරිසරය ඇගයීමට ලක්කර ඇති අයුරු